**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2015**

**-------------------------------------------**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංරගිප්‍ර) වලට අනුකූල වීම.

ශ්‍රීලංරගිප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ - පෙර වර්ෂයන් තුළදී රු.මිලියන 278 ක පිරිවැයකට මධ්‍යස්ථානය විසින් ප්‍රසම්පාදනය කරන ලද හා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රමිතියේ 65 වගන්තිය ප්‍රකාරව ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ සමාලෝචනය කිරීමෙන් තොරව හා වෙනස්කම් ගිණුම් ගත කිරීමෙන් තොරව භාවිතා කරමින් පැවතුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රු.මිලියන 5.28 ක පිරිවැයට 2013 හා 2014 වර්ෂවලදී ප්‍රසම්පාදනය කරන ලද වත්කම් නඩත්තු පිරිවැය ලෙස සාවද්‍යව ලියා හැර තිබූ අතර මෙම දෝෂය සමාලෝචිත වර්ෂය තුළදී නිවැරදි කර තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන ඒ අනුව යළි ප්‍රකාශ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආපදා කළමනාකරණය හා අවදානම් අවම කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 18 කට ප්‍රේෂණය කරන ලද රු.මිලියන 18.21 ක මුදලක්, 2015 දෙසැම්බර් 31 වන විටත් එම කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණද, සම්පූර්ණ කරන ලද වැඩ ලෙස සලකා ඒ අනුව ගිණුම් වලට ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2010 වර්ෂයේදී රු.මිලියන 1,034.39 ක පිරිවැයකට මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, අරමුදල් සපයන ව්‍යාපෘතියක් විසින් වෙන් කරන ලද අරමුදල් යොදා ගනිමින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක ඉදිකර තිබුණි. කෙසේ වුවද අදාළ ඉඩමේ අයිතිය මධ්‍යස්ථානයට පවරා නොතිබීම හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් පිරිවැය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුළ පරිත්‍යාග ලෙස මධ්‍යස්ථානයට ලැබුණු එන්ජින් සහිත ගලවා ගැනීමේ බෝට්ටු 15 ක්, ලැප්ටොප් පරිගණක 05 ක්, කැමරා 05ක්, මුද්‍රණ යන්ත්‍රයක් හා වෙනත් වත්කම් අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඉ) මධ්‍යස්ථානයට 2016 ජනවාරි මාසයේදී ලැබුණු රු.මිලියන 20.36ක් වටිනා ගම්බූට්ස් 300 ක තොගයක්, අතින් ක්‍රියාකරන සයිරන් 241 ක් හා ප්ලාස්ටික් ජල ටැංකි 100 ක් යන තොග 2015 දෙසැම්බර් 31 දිනට අතැති තොග ලෙස සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාවද්‍යව දක්වා තිබුණි.

(ඊ) හදිසි ශිල්පීය ක්‍රම සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය ව්‍යාපෘතියෙන් (International Centre for Emergency Techniques Project) ලැබුණු රු.මිලියන 1,244 ක ප්‍රදාන, පිටපත් කිරීමේ දෝෂ හේතුවෙන් රු.මිලියන 2.85 කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.628,008 ක් වූ ගෙවිය යුතු ගිණුම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඌ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ සන්නිවේදන උපකරණ සඳහා ක්ෂය සහ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් වටිනාකම පිළිවෙලින් රු.214,080 කින් හා රු.91,097 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3. පැහැදිලි නොකළ වෙනස්කම්**

**--------------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අත්තිකාරම් ශේෂයන් 04 ක හා අනුරූපී වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුවේ රු.371,066 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**2.2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම**

**----------------------------------**

අවශ්‍ය තොරතුරු හා ලිඛිත සාක්ෂි නොමැති වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(අ) රු.334,588 ක් පිරිවැය වූ ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාවට අයත් ජංගම නොවන වත්කම් භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් වෙනත් විවිධ ස්ථානවල ඉන්වෙන්ට්‍රි ලේඛන කිහිපයක් පවත්වා තිබූ බැවින් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා වෙනත් තොග පිළිබඳ විස්තර විගණනය සඳහා අප්‍රමාදව ලබා ගැනීමට නොහැකි විය.

(ඇ) දිස්ත්‍රික්ක 06 ක පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් වලට අදාළව 2015 ජනවාරි සිට ජූනි දක්වා කාල පරිච්ඡේදය තුළ පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 371(5) ට අනුව ලබාදෙන ලද සියලු අත්තිකාරම් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම නිරවුල් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ ලබා දෙන ලද එකතුව රු.මිලියන 2.58 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකර පැවතුණි.

(ආ) මධ්‍යස්ථානයට අයත් මෝටර් වාහන 09ක් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 14ක දී අනතුරුවලට භාජනය වී තිබුණද, මූලික විමර්ශනයන් පිළිබඳ වාර්තා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද එම අනතුරු පිළිබඳ විස්තර මුදල් රෙගුලාසි 110 ට අනුකූලව හානි ලේඛනයක ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 15.76 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.මිලියන 2.62 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු.මිලියන 18.38 ක පිරිහීමක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 51.04 කින් වෙනත් ආදායම අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේවුවද, පහත දැක්වෙන පරිදි වූ ගැලපීම් කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා වූ ඉහත ඌනතාවය රු.මිලියන 49.04 ක අතිරික්තයක් වි තිබුණි.

| විස්තරය | මුදල |
|---|---|
| | රු.මිලියන |
| වර්ෂය සඳහා ඌනතාවය | (15.76) |
| එකතු කළා - පාරිශ්‍රමික | 59.28 |
| ප්‍රාග්ධන ප්‍රදාන මත ක්ෂය හා ක්‍රම ක්ෂය | 5.52 |
| වර්ෂය සඳහා අතිරික්තය/දායකය | 49.04 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කුඩා පරිමාණයේ ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති 83ක් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානය සැලසුම් කර තිබුණු අතර මෙම කාර්යය සඳහා රු.මිලියන 505.39 ක මුදලක් රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණි. කෙසේ වුවද ඒ සඳහා ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාලනයන්, අධීක්ෂණය හා පසු විපරම් ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමක නොවූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත විස්තර කෙරේ.

(i) මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, කුඩා පරිමාණයේ ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති 42 කට අදාළ කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසානයට ඉටු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන භාගයේදී කාර්යයන් ආරම්භ කිරීම, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන්, ප්‍රදේශයේ පැවති සමාජ උද්ඝෝෂණ හා අහිතකර දේශගුණික තත්ත්වයන් වැනි කරුණු කිහිපයක් හේතුවෙන් එම අවම කිරීම් ව්‍යාපෘති සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට නොහැකි වූ බව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණි.

(ii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම හා ඒ පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට පැවරී තිබුණි. කෙසේ වුවද, අරමුණු කළ කාර්යයන් සඳහා වෙන් කරන ලද අරමුදල් උපයෝජනය පිළිබඳ අධීක්ෂණ පාලනයන්

මධ්‍යස්ථානය විසින් ප්‍රමාණවත්ව සිදු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අවස්ථා පහත දැක්වේ.

- දිස්ත්‍රික් මට්ටමින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 176.49 ක මුදලක් මුදා හැර තිබුණද, දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ආපදා කළමනාකරණ හා අවම කිරීමේ ව්‍යාපෘති 38 ක් පිළිබඳ වැඩ නිම කිරීමේ වාර්තා 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර නොතිබුණි.

- කොන්ත්‍රාත්කරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹීමෙන් තොරව රු.මිලියන 191.43 ක් වටිනා ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 34 ක් සඳහා කොන්ත්‍රාත්තු බාහිර පාර්ශවයන් සඳහා ප්‍රදානය කර තිබුණි.

- රු.මිලියන 77.90 ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 26 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය. කෙසේවුවද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 57.59 ක මුදලක් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට මුදා හැර තිබුණි.

(iii) කුඩා පරිමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කරන ලද අරමුදල් මධ්‍යස්ථානය විසින් මුදාහැර තිබුණේ සමාලෝචිත වර්ෂය අවසානයේදී බව තවදුරටත් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති නිශ්චිත කාලපරිච්ඡේද ඇතුළත ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. රු.මිලියන 52.45 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති 12 කින් ව්‍යාපෘති 11ක් සඳහා පමණක් 2015 දෙසැම්බර් මාසයේදී කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ තිබූ බව විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය විය. ඉතිරි ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් ගිවිසුම 2016 ජනවාරි මාසයේදී එළඹ තිබුණි.

(iv) මූල්‍ය පාලනයන් ශක්තිමත් කිරීම සඳහා අදාළ ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය මත පදනම් ව අරමුදල් මුදා හරිනු වෙනුවට, පරිචයක් වශයෙන්, ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආරම්භක අදියරේදී මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට සම්පූර්ණ මුදල් වෙන් කිරීම් මුදා හරිනු ලැබේ. මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පැහැදිලි කිරීමට අනුව සමහර ව්‍යාපෘති සඳහා විශේෂිත අවස්ථාවල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉල්ලීම් කරන ලද පරිදි සම්පූර්ණ වෙන් කිරීම මුදා හරින ලදී.

(v) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2015 අගෝස්තු මාසයේදී සංශෝධනය කළ බවත්, පෙර ක්‍රියාකාරී සැලැස්ම යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 33 ක් සංශෝධිත සැලැස්මෙන් ඉවත් කර තිබූ බවත් නිරීක්ෂණය විය.

(ආ) විගණනය සඳහා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීම සඳහා අපේක්ෂා කරන ලද ජලගැලීම් අවම කිරීමේ විශාල ව්‍යාපෘති 03ක් මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කර තිබූ අතර, ඉන් යාපනය අර්ධද්වීපයේ ජලගැලීම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැඩ පමණක් සමාලෝචිත වර්ෂය තුළ නිම කර තිබුණි. දඹුල්ල ජලගැලීම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 95 ක් පමණක් වෙන් කර තිබුණද, එම කාර්යය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙත 2015 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 114.79 ක මුදලක් ප්‍රේෂණය කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය යටතේ වැඩ, 2016 ජූනි 30 දින වන විටත් නිම කර නොතිබුණි. තවද කළුතර ජලගැලීම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැඩ සඳහා රු.මිලියන 139 ක් වූ සම්පූර්ණ වෙන් කිරීම 2015 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් වෙත මුදා හැර තිබුණද, 2016 ජූනි 30 වන විටත් එම ව්‍යාපෘතිය

සම්පූර්ණ කර නොතිබුණි. මේ අතර මෙම ව්‍යාපෘතිය යටතේ කරපන්-ඇල කාණු පද්ධතියේ සංවර්ධන වැඩ 2014 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද, රු.මිලියන 16.14 ක පිරිවැයකට සංවර්ධන වැඩ නිම කිරීම සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණේ 2015 දෙසැම්බර් 01 දින දීය.

(ඇ) මධ්‍යස්ථානයේ දැනුවත් කිරීමේ අංශය විසින් පැවැත්වීම සඳහා සැලසුම් කර තිබූ සිද්ධි විධාන පද්ධතිය (Incident Command System) පිළිබඳ පුහුණු වැඩ මුළුවක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණි. තවද, ආපදා පෙර සූදානම් හදිසි ප්‍රතිචාර සැලසුම් (Disaster Preparedness Emergency Response Plans) සංශෝධනය කිරීම සඳහා මධ්‍යස්ථානයේ පෙර සූදානම් සැලසුම් අංශය විසින් පැවැත්වීම සඳහා අපේක්ෂා කර තිබූ වැඩ සටහන් 04 ක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාදුක්ක පිහිටි තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය හා එහි සවි කරන ලද රු.මිලියන 72.47 ක් වටිනා උපකරණ 2011 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. පසුව අදාළ උපකරණ ගලවා 2015 මැයි 15 දින සිට මධ්‍යස්ථාන ගබඩා වල තබා තිබුණි. එබැවින් පෙර වර්ෂවල බරපතල ස්වාභාවික ආපදාවන්ට රට මුහුණ පා සිටියද, සැටලයිට් තාක්ෂණය යොදාගැනීම මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබූ ආපදා කළමනාකරණ වැඩ සටහන සඳහා සැලසුම් අත්හැර දමා තිබුණි. මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ට අනුව, විධිමත් අධ්‍යයනයකින් තොරව හදිසි ශිල්පීය ක්‍රම සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථාන ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේදී තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලද අතර, මධ්‍යස්ථානය විසින් ස්ථාපිත කරන ලද අනෙකුත් පද්ධතිවලට එය අනුකූල වී නොතිබුණි. එබැවින් උපකරණ ගලවා කොළඹ මධ්‍යස්ථානයේ ගබඩාවලට ගෙන යැමට කටයුතු කළ අතර උපකරණ මෙන්ම අනුගමනය කරන ලද තාක්ෂණයද ඒ අනුව අභාවිත විය. තවද තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ හිමිකරු වූ ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් ඔවුන්ගේ කටයුතු සඳහා අදාළ ඉඩම මුදාහරින ලෙස ඉල්ලීමක්ද කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කරන ලද කාර්යයන් රේඛීය අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වී නොතිබුණි. රේඛීය අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාර්යයන් 40 ක් හා රත්නපුර දිස්ත්‍රික්කයේ තවත් කාර්යයන් 09ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද මධ්‍යස්ථානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාර්යයන් 09ක් හා රත්නපුර දිස්ත්‍රික්කයේ කාර්යයන් 04 ක් පමණක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. තවද රේඛීය අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කාර්යයන් 02 ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එක් කාර්යයක් පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හා පොළොන්නරු දිස්ත්‍රික්කයේ පිළිවෙලින් කාර්යයන් 13 ක් හා 16 ක් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් සැලසුම් කර තිබුණි.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මධ්‍යස්ථානයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 266 ක් හා 226 ක් වූයෙන් එදිනට තනතුරු 40 ක පුරප්පාඩු පැවතුණි. අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ

හා සහකාර අධ්‍යක්ෂ තනතුරු වශයෙන් ප්‍රධාන කළමනාකරණ තනතුරු 2011 වර්ෂයේ සිට පුරප්පාඩු වී පැවති අතර මධ්‍යස්ථානයේ පහසු ක්‍රියාකාරිත්වය සඳහා එය අයහපත් ලෙස බලපා තිබුණි. මධ්‍යස්ථානයේ බඳවා ගැනීම් හා උසස් වීම් පටිපාටියට අනුව, මධ්‍යස්ථානයේ මානව සම්පත් හා මූල්‍ය හා පරිපාලන කටයුතු මානව සම්පත් හා මූල්‍ය අධ්‍යක්ෂවරයාගේ විෂය පථය යටතේ පැවති අතර එම තනතුර වර්ෂ 05කට වැඩි කාලයක් පිරවීමෙන් තොරව පැවතුණි. මධ්‍යස්ථානයේ මානව සම්පත් කළමනාකරණය හා මූල්‍ය කාර්යයන් 2011 වර්ෂයේ සිට සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් ක්‍රියාත්මක කරන බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) මධ්‍යස්ථානයේ බඳවාගැනීම් හා උසස්වීම් පටිපාටියට අනුව, අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය ආයතනයක කළමනාකරණ තනතුරක වර්ෂ 15 ක පළපුරුද්දක් අවශ්‍ය වේ. කෙසේවුවද එම පළපුරුද්ද නොමැති පුද්ගලයන් එම තනතුරු සඳහා බඳවා ගෙන තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ආපදා කළමනාකරණ පනත ස්ථාපිත කිරීම

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කරන ලද ජාතික ආපදා කළමනාකරණ සභාවේ විෂය පථය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරනු ලැබේ. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් මධ්‍යස්ථානයට අතිරේක බලතල පැවරීමට හැකිවන පරිදි පනත සංශෝධනය කිරීමට කෙටුම්පත් පනත 2014 ජූනි 16 දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබුණද කෙටුම්පත් පනත, 2016 මැයි 31 වන විටත් අනුමත කර නොතිබුණි.

### 5.2 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ විධිවිධාන ප්‍රකාරව හදිසි තත්ත්වයකදී ගලවාගත් පුද්ගලයින් හා දේපල පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේ අරමුණින් මධ්‍යස්ථානය විසින් පිළියෙල කරන ලද ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම රටට ඉතා අත්‍යවශ්‍ය වුවද පහත සඳහන් කරුණු හේතුවෙන් එය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(අ) මධ්‍යස්ථානය විසින් ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ආපදා කළමනාකරණ සභාවේ අතුරු කළමනාකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු රජයේ දෙපාර්තමේන්තු 48 කින් රජයේ දෙපාර්තමේන්තු 07 ක අදහස් දැක්වීම්, එම දෙපාර්තමේන්තුවල කාර්යයන් හා වගකීම් මාරු වීම, සැලැස්ම පිළියෙල කිරීම සඳහා සහභාගි වූ නිලධාරීන් වෙනත් දෙපාර්තමේන්තුවලට මාරු කිරීම හා ඒ පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ගවල ප්‍රමාදයන් වැනි විවිධ කරුණු හේතුවෙන් 2016 ජූනි 30 වන විටත් මධ්‍යස්ථානයට ලැබී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් සැලැස්ම 2016 ජූනි 30 වන විටත් අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

### 5.3 වාහන උපයෝජනය

ප්‍රවාහන ඒකකයෙන් ලැබුණු තොරතුරු අනුව මධ්‍යස්ථානයේ වාහන සංචිතයේ මෝටර් වාහන 39ක් විය. කෙසේ වුවද මෝටර් වාහන 37 ක තොරතුරු පමණක් ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන්ව තිබුණි. ඉන් මෝටර් වාහන 07 ක් පමණක් මධ්‍යස්ථානය නමින් ලියාපදිංචි කර තිබූ අතර අනෙකුත් වාහන රේඛීය අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ මෝටර් වාහන පිළිබඳ භාණ්ඩ සමීක්ෂණයක් මුදල් රෙගුලාසි 756 හි නියමය පරිදි සිදු කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යයන් සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කර තිබුණද, නිලධාරීන් දෙදෙනෙකු පමණක් අභ්‍යන්තර විගණන ඒකකයට අනුයුක්ත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම, වියදම හා වෙනත් මෙහෙයුම් කාර්යයන් වලින් සියයට 30 ක් අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයට භාජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා 15 ක විගණන නිරීක්ෂණ පිළිබඳ කළමනාකරණයේ අදහස් දැක්වීම් 2015 දෙසැම්බර් 31 දිනට ලැබී නොතිබුණි.

## 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා තිබූ අවශ්‍ය ප්‍රමාණයන්ට වැඩියෙන්, ගලවා ගැනීම් මළු, කූඩාරම් හා පිරික්සා බැලීම් උපකරණ වැනි විෂයයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා කටයුතු කර තිබූ බවත්, ඒ සඳහා රු.මිලියන 4.30 ක මුදලක් අතිරේකව වැය කර තිබූ බවත් නිරීක්ෂණය විය. ප්‍රාග්ධන විෂයයන් 10 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.මිලියන 75ක මුදලක් ප්‍රසම්පාදන සැලැස්මේ වෙන් කර තිබූ අතර, 2015 ජූනි 30 ට පෙර එම ප්‍රසම්පාදනයන් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවුවද එම වත්කම් ප්‍රසම්පාදනය කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි. එබැවින් මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන සැලැස්ම, මූල්‍ය පාලනය පිළිබඳ ඵලදායී උපකරණයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා, මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගබඩා කළමනාකරණය | ගබඩාවට භෞතිකව ලැබී නොතිබුණු රු.මිලියන 20.36 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 2015 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. |
| (ආ) | ගිණුම්කරණය | විගණන වාර්තාවේ පෙන්වා දෙන ලද ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |
| (ඇ) | අත්තිකාරම් නිරවුල් කිරීම | බාහිර පාර්ශවයන් සඳහා මෙන්ම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයටද ලබා දෙන ලද අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව එම අත්තිකාරම් දීර්ඝ කාලයක් හිඟ හිට පැවතුණි. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | විශේෂිත දැනුමක් හා හැකියාවන් සහිත කාර්ය මණ්ඩලයක් නොමැතිව මධ්‍යස්ථානය ක්‍රියාත්මක කර තිබුණි. එබැවින් ආපදා කළමනාකරණය පිළිබඳ මධ්‍යස්ථානයේ අනාගත මානව සම්පත් අභියෝගවලට මුහුණ දීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව මධ්‍යස්ථානය විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. |